# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2009 අංක 48 දරන බණ්ඩාරගම වික්‍රමශිලා ධර්මායතන සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 සැප්තැම්බර් මස 24 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 සැප්තැම්බර් මස 25 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2009 අංක 48 දරන බණ්ඩාරගම වික්‍රමශිලා ධර්මායතන සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 සැප්තැම්බර් මස 24 වන දින]

එල්.ඩී.—ඕ. (අයි.එන්.සී.) 4/2008

### බණ්ඩාරගම වික්‍රමශිලා ධර්මායතන සමාජ සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"වික්‍රමශිලා ධර්මායතන සමාජ සේවා පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක්, ඒ පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී පදනමට සම්බන්ධ සියලු කරුණු හා පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් බණ්ඩාරගම පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කිරීමට ඉල්ලීමක් කර ඇති හෙයින් ද එම ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2009 අංක 48 දරන බණ්ඩාරගම වික්‍රමශිලා ධර්මායතන සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

බණ්ඩාරගම වික්‍රමශිලා ධර්මායතන සමාජ සේවා පදනම සංස්ථාගත කිරීම.

2. (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) බණ්ඩාරගම වික්‍රමශිලා ධර්මායතන සමාජ සේවා පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව බණ්ඩාරගම වික්‍රමශිලා ධර්මායතන සමාජ සේවා පදනම යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් බවට පත් වන්නේ ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

PL 004182-2,650 (2009/07)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. (1) සංස්ථාව සංස්ථාගත කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ය :—

(අ) බණ්ඩාරගම ධර්මායතන පිරිවෙන සහ පහත සඳහන් ඊට අනුබද්ධ ආයතනයන් හි—

(i) ශ්‍රී පඤ්ඤාලංකාර දහම් පාසල සඳහා ;

(ii) වික්‍රමශිලා කලායතනය ;

(iii) වික්‍රමශිලා කාර්ය සාධක සමිතිය ;

(iv) බණ්ඩාරගම ප්‍රජා සංවර්ධන පදනම ;

(v) සංඝමිත්තා කුළඟන සමිතිය ;

(vi) සමගි අවමංගල්‍යාධාර සමිතිය ;

(vii) වික්‍රමශිලා මහ පෙරහැර සංවිධානය,

සඳහා අවශ්‍ය දෑ සැපයීම, නඩත්තු කිරීම සහ සාර්ථක ලෙස පවත්වාගෙන යාම, සමාජ සහ සංස්කෘතික තත්ත්වය දියුණු කිරීම ;

(ආ) නව චෛත්‍ය ඉදි කිරීම සහ මෙම ආයතනයේ පිහිටි භූමිය සංස්කෘතික වශයෙන් වැදගත්කමක් ඇති ස්ථානයක් බවට තවදුරටත් ආරක්ෂා කර වැඩි දියුණු කිරීම ;

(ඇ) ප්‍රදේශයේ දිළිඳු සහ අසරණ අය සඳහා නිවාස, සෞඛ්‍ය පහසුකම්, පිරිසිදු පානීය ජලය අවශ්‍යතාවන් සපුරාලීම ;

(ඈ) දිළිඳු හා සැත්කම් වැනි අවස්ථාවන් ඇති අයවලුන්ට මූල්‍යමය උපකාර කිරීම ;

(ඉ) ජාතික වටිනාකමකින් යුත් එම ප්‍රදේශයේ යම් අදාළ දේපළ ආරක්ෂා කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා කටයුතු කිරීම ;

(ඊ) දිස්ත්‍රික්කයේ දුප්පත් සහ අසරණ පාසල් දරුවන්ගේ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා අවශ්‍ය උපකරණ හා පහසුකම් සැපයීම ;

(ඌ) ප්‍රදේශයේ දරු දැරියන්, තරුණ තරුණියන් සහ වැඩිමහල් අයගේ පෝෂණ තත්ත්වයන් නගා සිටුවීම සහ ක්‍රීඩා දක්ෂතාවයන් වැඩි දියුණු කර ජාතික මට්ටමට ගෙන ඒමට කටයුතු කිරීම ;

(ඍ) විශේෂයෙන් අසරණ ළමයින් සඳහා ළමා නිවාස ඇති කිරීම සහ පවතින එම ආයතනවල පහසුකම් වැඩි දියුණු කිරීම ;

(එ) අදාළ අධිකාරයන් විමසීමෙන් කාර්මික සහ තාක්ෂණ විද්‍යා පිළිබඳ සහ උසස් අධ්‍යාපන කටයුතු සඳහා විදේශයන්හි ශිෂ්‍යත්ව පිරිනැමීම, ස්වාභාවික ආපදාවන්හි දී සහ හදිසි විපත්වල දී සහන සැපයීම ;

(ඒ) ප්‍රදේශයේ ජනතාව සඳහා වන්දනා චාරිකා සඳහා පහසුකම් සැලසීම.

(2) ඉහත අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී, ජාතිය, කුලය, ආගම, භාෂාව, ස්ත්‍රී පුරුෂ භාවය හෝ දේශපාලන මතය පදනම් වූ විශේෂත්වයක් නොසලකා සංස්ථාව විසින් එකී ක්‍රියාත්මක කිරීම කරගෙන යනු ලබන බවට සහතික විය යුතු ය.

නිලධාරීන් පත් කිරීම.

4. ලේකම්, සභාපති, භාණ්ඩාගාරික සහ ගණකාධිකාරීවරයාගේ පත් කිරීම මෙම පනත යටතේ සාදනු ලබන රීතිවලට අනුකූල විය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) 7 වන වගන්තිය යටතේ සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාවේ නිලධරයන්ගෙන් සහ එකී රීතිවලින් විධිවිධාන සලසා ඇති පරිදි වූ සහ ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සාමාජික සංඛ්‍යාවකින්, සමන්විත වන විධායක කමිටුවක් විසින් සංස්ථාවේ කටයුතු පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී නිල දැරූ පදනමේ විධායක කමිටුව සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව විය යුතු ය.

සංස්ථාවේ බලතල.

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, පහත සඳහන් දෑ සඳහා සංස්ථාවට බලය තිබිය යුතු ය :—

(අ) පළාතේ සංවර්ධනය සඳහා වූ යෝජනා ඉදිරිපත් කිරීම ;

(ආ) ගම්වාසීන් සඳහා අවශ්‍ය සේවා සැපයීම සහ ඔවුන් සැහීමට පත්වන පරිදි කාර්යය ඉටු කිරීම ;

(ඇ) සංස්ථාවේ ලේඛන සුරක්ෂිතව තැබීම සහ ඒවා ආරක්ෂා කිරීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ විදේශ ප්‍රභවයන්ගෙන් දායක මුදල්, ප්‍රදාන, පරිත්‍යාග, ත්‍යාග ලබා ගැනීම ;

(ඉ) කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා විධායක කමිටුව විසින් අනුමත කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසි මත ණය මුදල් ලබා ගැනීම ; සහ

(ඊ) සංස්ථාවේ අරමුණු ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය හෝ වහා අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා සහ දේ ඉටු කිරීම.

සංස්ථාවේ රීති.

**7.** (1) සංස්ථාවේ යම් මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන කරුණු සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාව විසින් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් ඇතුළු කර ගැනීම, ඔවුන් වර්ග කිරීම සහ ඔවුන් නෙරපීම ;

(ආ) නිලධරයන් සහ විධායක කමිටුව තෝරා පත් කර ගැනීම සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන් විසින් ඉටු කළ යුතු කාර්යය භාරය ;

(ඇ) සංස්ථාවේ සහ විධායක කමිටුවේ රැස්වීම්වල කටයුතු කර ගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය ;

(ඇ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම හා ඒවා විගණනය කිරීම ; සහ

(ඉ) සාමාන්‍යයෙන්, සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ යම් රීතියක්, ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන් ම, සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

8. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාර ගන්නා ලද හෝ මින් මතු භාර ගනු ලබන ත්‍යාග, රික්තවරණ, පැවරීම්, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන සංස්ථාව විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

9. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති පදනමේ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියළු ණය, ගෙවිය යුතු දායක මුදල් හෝ පදනමට ගෙවිය යුතු සම්මාදම් මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය. පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අය විය යුතු ණය.

10. සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති නිලධරයන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. එකී නිලධරයන් විසින් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන්, එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

විගණනය සහ ගිණුම්.

**11.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා ආයතනයක සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.

**12.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු, ණය හා බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

13. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

14. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.